# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/13 - 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාව විස්තර:*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුවන්නා කෝරලේ පහත විස්තර කර ඇති ඉඩම.

ග්‍රාම නිලධාරි වසම: 206 පොතුවැව; ගම: පොතුවැව; අ.ග.පි. අංකය: 2378; සිතියම් කළ දිනය: 2018.10.29; කැබලි ගණන 02.

01. **කැබලි අංකය 124**

ඉඩමේ නම: මොරගොඩමූකලාන; ඉඩම් පරිහරණය: වත්ත; හිමිකම් කියන්නා: සේනානායක සෙනරත් බංඩාරලාගේ ප්‍රියංකා බණ්ඩාර මැණිකේ; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.8094.

02. **කැබලි අංකය 125**

ඉඩමේ නම: මොරගොඩමූකලාන; ඉඩම් පරිහරණය: වත්ත; හිමිකම් කියන්නා: සේනානායක සෙනරත් බංඩාරලාගේ ප්‍රියන්ත බණ්ඩාර; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.8094.

**එකතුව: හෙක්. 1.6188.**

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.02.06 වැනි දින පෙ. ව. 10.00 ට මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.01.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. එම්. ජේ. එම්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්/අත්පත් නිලධාරි,
මහව, කුරුණෑගල දිස්ත්‍රික්කය.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

01 - 324

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29174 - 17 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.